## 09. වන්නි නැවත පදිංචි කිරීමේ ජාතික කර්තව්‍යය හා ලාංකේය අනන්‍යතාව පිළිබඳ සමාජ විද්‍යාත්මක පර්යාවලෝකනය

යුද්ධය යනු ඛේදවාචකයකි. එම ඛේදවාචකය ජයග්‍රහණයකින් අවසන් කළ රටවල් ලොව ඇත්තේ අතලොස්සකි. ත්‍රස්තවාදය පරාජය කළ පසු එම කලාපවල ගොඩනැගිය යුතු අංශයන් බොහෝය. එය ක්‍රමානුකූලව සැලසුම් සහගතව කලයුතු වැඩපිළිවෙලකි.

මෙම ගම්මානවල සිංහල වැසියන් නැවත පදිංචි කිරීමේ කටයුතු පශ්චාත් යුධ සමයෙන් පසු දෙවන පියවර වශයෙන් 2012 වසරේ අග භාගයේදී සිදුකරන ලද අතර ඒ සඳහා අවශ්‍ය දත්ත සපයා දෙමින් වෙහෙස මහන්සි වූ කාර්යමණ්ඩලය ද අගය කල යුතුය.



හමුදා නායකත්වය

මේ සඳහා වන්නි ආඥාපතිවරයා මූලිකත්වයෙන් 563 බල සේනාධිපතිවරුන් සහ 623 බල සේනාධිපතිවරුන් 7 වන ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව, 26 වන ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව, 19 වන (ස්වෙච්ඡා), ගජබා රෙජිමේන්තුව සහ 11 වන ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුව යන ඒකක අණදෙන නිළධාරීවරුන් ඇතුළු සියළු නිළධාරින්ගේ අප්‍රතිහත ධෛර්ය මත මෙම සංවර්ධන ක්‍රියාවලිය මල්ඵල ගැනුණු බව අදවන විට සියල්ලෝම දන්නා කරුණකි.

හිටපු යුධ හමුදාපතිතුමන්ගේ සංකල්පයකට අනුව මෙම ගම්මාන අතුරන් ඓතිහාසික වටිනාකමක් ඇති නන්දිමිත්‍රගම පදිංචි පවුල් 310 වෙනුවෙන් අංග සම්පූර්ණ ස්ථිර නිවාස 310 ක් ඉදිකර දීමේ සත්කාර්යයේදී යුධ හමුදා මූලස්ථානය, ආරක්ෂක සේනා (වන්නි) සහ ඒ යටතේ ඇති බලසේනා, යුධ හමුදාවේ සියලු බලකා සහ රෙජිමේන්තුවල ඒකක වෙතින් දක්වා ඇති මූල්‍යමය සහ ශ්‍රම දායකත්වය විශේෂයෙන් සඳහන් කලයුතු කරුණකි. කුරිරු යුද්ධයේ සේයාවන් මකාලමින් අනාගත ලංකාව තුළ සාමකාමී පරිසරයක් නිර්මාණය කරනු වස් සිදුකරනු ලබන මෙම ක්‍රියාදාමය ලක්බිමේ දියුණුව පතන සියල්ලන්ගේම පැසසුමට ලක්විය යුතු සංසිද්ධියක් බව සඳහන් කල යුතුය.

**වන්නි නැවත පදිංචි කිරීම, ලාංකේය සමාජ ව්‍යුහය හා අනන්‍යතාව තහවුරු කිරීමට බලපාන ආකාරය**

වන්නි ප්‍රදේශය ජනාවාස වීමේ ඉතිහාසය පූර්ව ඓතිහාසික යුගය දක්වා දිවෙන බවට කිසිදු සැකයක් නොමැත. අන්‍යෝන්‍යය සබඳතාවන් තහවුරු කරමින් පැවති සමාජ රටාව, සිංහල සංස්කෘතිය

හා බැඳුනු ස්වයංපෝෂිත අර්ථ ක්‍රමයක් වර්ධනය වූ බවට පුරාවිද්‍යා සාක්ෂි මොනවට පැහැදිලි කරයි. ගමයි, පන්සලයි, වැවයි, දාගැබයි යන සංකල්පීය ප්‍රවේශය තුළ තහවුරු වූ සිංහල ගමක් සඳහා සාධනීය සාධක ලංකාවේ වෙන කවර කලාපයකටත් වඩා වන්නි කලාපය තුළ දක්නට ලැබේ. ශ්‍රී ලංකාවේ පුරාණ ගම පිළිබඳ අදහස් දක්වන ජෝන් බර්ඩ්සියර් (John Buddphear) සඳහන් කරන පරිදි,

> **"උස් තැනක සිට වැව නිරීක්ෂණය කරන විට, බැබලෙමින් පැවති ජලාශයක් හා සම්බන්ධ වූ රන්වන් පැහැති ගොයම්, කෙත් නැම්ණි. තිත්වලින් පුල්ලි වැටුණු අතුරක් නොමැතිව කැලැවක් සේ දිස් වේ. වැව් පළාතේ විශේෂ ලක්ෂණයක් වූ කේන්ද්‍රගත ගම, ගමේ කුඹුරු අසබඩ පිහිටි නිවස සමූහයන්ගේ සැදුණි. පළතුරු සහ එළවළු වැවීම සඳහා වූ වත්තකින් සෑම නිවසක් ම වටවී තිබිණි. වරිච්චි බිත්තියෙන් සහ පිදුරුවලින් සෙවිලි කල වහලෙන් යුතු මෙම නිවසක සාමාන්‍යයෙන් කාමර දෙකක් හෝ බරාඳයක් තිබිණි. ගෙපල ඉදිරිපට ධාන්‍ය තැම්පත් කර තිබීම සඳහා චේවැල් වලින් සාදන ලද දවුල් කදක හැඩයෙන් යුත් අටුවක් විය. ගෙය පිටුපස හරකුන් සඳහා තනන ලද මඩුවකි. එම මඩුව තුළ ගොවි උපකරණ තිබීම සඳහා අට්ටාලයක් තිබුණි"(අමරතුංග. 2003: 73).**

වන්නි ප්‍රදේශයේ ගම පිළිබඳ නිරීක්ෂණය කිරීමේ උක්ත සඳහන් පුරාණ ගම, එහි ව්‍යුහය හා අංගයන්ගෙන් සමන්විත වූ බවට සාධක ප්‍රමාණවත් පරිදි සොයාගත හැකි ය. වැව සහ ඉන් පෝෂණය වන

කුඹුරු යාය, හේන, ගම්ගොඩ, විහාරය හා සරල ප්‍රාදේශීය පාලන ව්‍යුහයකින් සමන්විතව ගම විග්‍රහ කරනු දක්නට ලැබේ. ආචාර්ය උබේසේකර විසින් 2003 සමාජ සමීක්ෂා, තෙවන කලාපයට ලිපියක් සපයමින් නුවර කලාවියේ පුරාණ ගම හා එහි ව්‍යුහය උපුටා දක්වා ඇත.




සාම්ප්‍රදායික ගමක ව්‍යුහය

1. වැව 2. ඇල 3. කුඹුරු යාය 4. වැව් බැම්ම 5. ජනාවාස 6. ගම්පති නිවස 7. පන්සල 8. දඬුවැඩ 9. සමාජ සම්බන්ධතා 10. හේන් යාය 11. වෙළඳපොළට යන පාර 12. ගම් නිවාස හා ගෙවතු වගා බිම් 13. වෙනත් ගම්වලට යන පාර (දිසානායක, 2003: 102)

වැව හා ගම යන සංකල්පීය සබඳතාවය මෙහි සඳහන් වේ. මෙම ප්‍රදේශයේ පැවති මේ වන විට නටබුන් ව පවතින වැව් හා අනෙකුත් පුරාවිද්‍යාත්මක සාධක මෙම ජනාවාසවීම හා එහි පැවැත්ම පිළිබඳ ව සාක්ෂි දරයි. වියළි කලාපයේ නැවත පදිංචි කිරීමට පියවරගෙන ඇත්තේ සංවර්ධනයට හා නවීකරණයට බාධා නොවන පරිදි සාම්ප්‍රදායික සමාජ ව්‍යුහය යළි ස්ථාපිත කරමිනි. වන්නි කලාපය තුළ රජයේ සහ යුධ හමුදා මැදිහත්වීම තුළ ප්‍රදේශයේ වැව් අමුණු ප්‍රතිසංස්කරණය කරලීම, ජල සැපයුම විධිමත් කරලීම, කුඹුරු අස්වැද්දීමට අවශ්‍යය සියලු පහසුකම් සැපයීම, එහිදී ශ්‍රමදායකත්වයේ සිට බීජ ලබාදීම, තාක්ෂණික දැනුම ලබාදීම හා නිරීක්ෂණ ඉඩම් ලබාදීම, නිවාස ඉදිකිරීම, ගෙවතු වගාව, පුරාණ වෙහෙර විහාර ප්‍රතිසංස්කරණය, නව වෙහෙර විහාර ඉදිකිරීම, කිරි ගවයින් ලබාදීම එහි අංශයන් තුළින් පශ්චාත් යුධ සමය තුළ යෝධ සංවර්ධන පියවරකට පා තබා ඇත.

මෙම කෘෂි අර්ථ ක්‍රමය ස්ථාපිත කරමින් එම ප්‍රදේශය ස්වයංපෝෂිත කරන අතරතුර යටිතල පහසුකම් සංවර්ධනය පුද්ගලාන්තර සබඳතා තහවුරු කිරීම සඳහා සමාජීය කටයුතු තහවුරු කිරීම, සංස්කෘතික වශයෙන් සමාජය උද්යෝගිමත් කිරීම හා පරිසර හිතකාමී වැඩපිළිවෙලක් දියත් කිරීම දක්නට ලැබේ. සංවර්ධනයේ

ඉහළ ප්‍රතිපල අපේක්ෂාවෙන් සිදුකරනු ලබන මෙම වැඩපිළිවෙල නුදුරු අනාගතයේදී ලංකාව තුළ පරිපූර්ණ මානව සම්පතහි ගුණාත්මක බව නංවාලන බවට ප්‍රබල ඉඟියකි.

මේ සියළු භෞතික ගොඩනැගීම් හා මානව අවශ්‍යතාවයන් ගොඩනැගීමේදී පුද්ගල සංකල්පවල ධනාත්මක වර්ධනය අතිශය වැදගත් කරුණකි. ඒ මත පිහිටා ඓතිහාසික උරුමය හා අනගි සිංහල පෞරුෂය විදහා දක්වමින් වන්නි කලාපයේ එක් ගමක් නන්දිමිත්‍ර යෝධයා සිහි කිරීම වෙනුවෙන් නම් කිරීම ක්‍රියාවට නැගුණ උදාරතර සංකල්පයකි. දුටුගැමුණු රජසමය තුළ ඇති වූ යුධ ගැටුම් ජයග්‍රහණය සඳහා කැප වූ නන්දිමිත්‍ර යෝධයා උපන් ගම මෙය වන අතර මෙම පිළිරුව එක් අතකින් කෘතගුණ සැලකීමේ උදාරතර සංකල්පය විදහා දක්වන අතර අනෙක් අතට රට ජාතිය වෙනුවෙන් කැප වූ රණවිරුවන්ගේ ශක්තිය විදහා දක්වයි.

උක්ත කරුණු සලකා බැලීමේදී පැහැදිලි වන්නේ එදා රණවිරුවන් ජීවිත පරිත්‍යාගයෙන් දිනා දුන් බිම වෙනුවෙන් යුතුකම් ඉටුකිරීමේ අනගි මෙහෙවරේ මෙදා රණවිරුවන් නියැලී සිටින බවට වන්නි නැවත පදිංචි කිරීමේ සහ සංවර්ධන ව්‍යාපෘතිය කදිම සාක්ෂියකි.

**පශ්චාත් යුධ සමය තුළ සංවර්ධන අභියෝග ජයගනිමින් වන්නිය ඉදිරියට**

යුද්ධයක් හේතු කොට ගෙන සමාජ සංවිධානය විසංවිධානකාරී වීම සාමාන්‍යය සංසිද්ධියකි. නමුත් යුද්ධය ස්වර්ණමය අවස්ථාවක් කරගෙන පෙරට වඩා ශක්තිමත්

සංවර්ධනයක් කරා ගිය රටවල් ද ලෝකයේ ඇත. ජපානය, කොරියාව මෙයට උදාහරණ ලෙස දැක්විය හැකි අතර ශ්‍රී ලංකාව ද නුදුරු අනාගතයේදී ම එම රටවල් අතරට එක් කරන්නට පශ්චාත් යුධ සමයේ ලංකාව තුළ ක්‍රියාත්මක වන සංවර්ධන වැඩසටහන් උත්සාහ දරයි. යුද්ධයෙන් පසු එම සංවර්ධන ක්‍රියාවලිය සඳහා දේශීය විදේශීය ආධාර මත නව තාක්ෂණය මුසුවූ නව ආර්ථික ආර්ථික සැලසුම්වලට අනුගත වූ ආර්ථික ප්‍රතිසංස්කරණ ලංකාව තුළ ක්‍රියාත්මක වේ. ඒ මත සීඝ්‍ර ආර්ථික සංවර්ධනයක් කරා යා හැකි ය. ලොව ප්‍රබල ත්‍රස්තවාදී කණ්ඩායමකට එරෙහිව තිස් වසරක යුද්ධයකට මුහුණ දුන් ශ්‍රී ලංකාව අද වන විට පශ්චාත් යුධ කලාපයේ ජනතාව පුනරුත්ථාපනය කිරීම සහ සංවර්ධනය කිරීම සඳහා පෙළඹී ඇත. උතුරු නැගෙනහිර පළාත් ප්‍රතිසංස්කරණය සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති හා උපාය මාර්ග හා වැඩසටහන් සම්පාදනය කරන අතර එහි ප්‍රතිලාභ ජනතාව භුක්ති විඳිමින් සිටියි.

වන්නි නැවත පදිංචි කිරීමේ වැසටහන තුළ ජනතා අභිලාෂයන් මල්ඵල ගන්වමින් නිහඬව යෝධ සංවර්ධන පියවරක් තබමින් සිටියි. ඓතිහාසික පුරාවිද්‍යාත්මක, ආර්ථික හා දේශපාලනික වැදගත්කමින් යුක්ත මෙම ප්‍රදේශයේ ජන ජීවිත තහවුරු කිරීමට සුදුසු පරිසර පද්ධතියකින් යුක්ත ය. යුධ හමුදාවේ මැදිහත් වීමෙන් වන්නි නැවත පදිංචි කිරීමේ වැඩ සටහන දියත් කරන ලද්දේ අනාගත දැක්මක් සහිතව ය. එමගින් ඔවුන් බලාපොරොත්තු වන්නේ යුද්ධය ඇතිවීමට බලපාන ඉච්ඡාභංගත්වය, සැහැසි බව, පූර්වමතය හා නොසලකාහැරීම්, තරඟකාරීත්වය වැනි සාධක තුරන් කරමින් මානව සමාජය තුළ ඒකාබද්ධතාවය තහවුරු කිරීමට ය. ජනතා සුබ සිද්ධිය තහවුරු කරනු වස් පශ්චාත් යුධ සමය තුළ ඉතා කෙටි කාලයකින්

මෙවන් දැවැන්ත සංවර්ධන වැඩසටහනක් මින් පෙර ක්‍රියාත්මක නොවූ තරම් ය. අද වන විට එම ව්‍යාපෘතින්හි අග්‍රඵල භුක්ති විඳීමට ජනතාවට අවකාශය විවර වී ඇත. ජනවිඥානය තුළ ලාංකේය බව සපත කරමින් අභිමානවත් ජීවිතයක් ලබා දීමට යුධ හමුදාව කැප වූ බවට එම ජනතාව සාක්ෂි සපයයි. එවැනි අදහස් කිහිපයක් මෙලස දැක්වීමට පුළුවන.

ආර්. ඩබ්. බණ්ඩා (54) සඳහන කරන පරිදි .....

> **"මගේ පවුලේ 4 දෙනෙක් ඉන්නවා අපි මෙම ප්‍රදේශයේ පදිංචියට ඇවිත් දැනට අවුරුදු දෙකක් විතර වෙනවා. දැන් යුද්ධය නැති නිසා බය නැතිව ජීවත් වෙන්න පුළුවන් හමුදාවේ මහත්වරුන්ගේ මැදිහත් වීමෙන් අපට ඉඩම් ලැබුණා ඒ විතරක් නෙමෙයි, ඒ මහත්වරු අපට ගෙයක් හදලා දුන්නා. වත්ත වවාගන්න උදව් කලා. වත්තේ වැවෙන එළවළු පලතුරු වව්නියාවේ පොළට අරගෙන ගිහින් විකුණනවා. අපි මේවට කෘතිම තෙල් පොහොර ගහන්නේ නැහැ. වස විස නැති එළවළු පළතුරු, දැන් මේ පැත්ත දියුණුවීගෙන එන්නේ, යුද්ධයෙන් පස්සේ අපි ලැබුවේ විශාල ජයග්‍රහණයක්.**

ආර්. ඩබ්. බණ්ඩා මහතා මීට වසර දෙකකට පෙර නන්දිමිත්‍ර ප්‍රදේශයේ පදිංචියට ආ ආයෙකි. ඔහු සමග සිදුකල සාකච්ඡාව තුළ තහවුරු වුයේ පශ්චාත් යුධ සමග තුළ උසස් ජීවන තත්ත්වයක් ලබාගැනීමට ඇවැසි පරිසරය සකස් වී ඇති බවයි.

නන්දිමිත්‍ර ගම පදිංචි ඩබ්. කිරිහතා 53 හැවිරිදි පුද්ගලයෙකි. මීට පෙර ගොවිතැනෙන් ලද පන්නර ඔහුගේ ගෙවත්ත තුළින් ඉස්මතු වී ඇත. කිරිහතා පවසා පරිදි

> යුද්ධය අවසන් කලාට පස්සේ අපේ හමුදාවේ මහත්වරුන්ට පිං දෙන්න ඕන. අද අපට නිදහසේ ජීවත් වෙන්න පුළුවන්. මම ගමට ඇවිත් දෑ අවුරුද්දයි මාස අටක් වෙනවා. හමුදාවේ මහත්වරු අපට ඉන්න ගෙයක් හදලා දුන්නා. වත්ත වගා කරන්න උදව් වෙනවා. මුලින් මාස හයක් යනතෙක් වියලි සලාක ආහාර දුන්නා. දැන් මේ ගමට විදුලිය ලබා දීලා තියෙන්නේ. මාස 6 ක් යනතෙක් මුදල් අයකර ගන්නෙත් නැහැ. ඇත්තෙන්ම හමුදාවේ මහත්වරු කරනා මෙහෙවර වචනයෙන් කියා නිම කරන්නට බැහැ. දැන් මේ ගමේ මිනිස්සු සතුටින් සාමදානයෙන් ඉන්නවා".



නන්දිමිත්‍ර ගම පදිංචි ඩබ්. කිරිහතා මහතා

යුද්ධයෙන් පසු සංවර්ධනයේ ප්‍රතිලාභ භුක්ති විඳින්නේ ඔවුන් ය. තවමත් සංවර්ධන ඉලක්ක කරා යන ගමනේ අතරමැද සිටින ශ්‍රී ලංකාව තුළ කඩිනම් සංවර්ධන ව්‍යාපාති ක්‍රියාත්මක වීම පැසසුම් ලැබිය යුතු කරුණකි. වේදනාව හරියටම දන්නේ තුවාලය ඇති මිනිසා ය. එමෙන් ම එය හොඳ වූ බව දන්නේ ද ඔහුය. පසු ගිය තිස් වසර තුළ ශ්‍රී ලංකාව අත්විඳි බාධාවන් පසුබෑම් දන්නේ ශ්‍රී ලාංකිකයෝ මිසක් ලංකාවේ යුද්ධය මාධ්‍යය හරහා හෝ වෙනත් අයෙකුගේ කට වචනයෙන් දැනගත් විදේශීයකයින් නොවේ. එදා මෙරට ජනතාවට අනාගතය පිළිබඳ සිහිනයක් නොමැති විය. ඔවුන් ජීවත් වුයේ ත්‍රස්තවාදයට බියෙන් ය. කුමන මොහොතක හෝ ජිවිතය අහිමිවේ ද යන සැකයෙන් ය. එහෙත් අද වන විට සියල්ල යහපත් අතට පරිවර්තනය වී ඇත. එහි ප්‍රථිපල මෙරට සිවිල් වැසියන් භුක්ති විඳියි. තිස් වසරක යුධ කාලයක තුළ වල් බිහිවූ වන්නි බිම එකම වගා බිමක් බවට පත්වී ඇත. නිවාස ගොඩනගමින් වැව් අමුණු ප්‍රතිසංස්කරණය කරමින් කුඹුරු අස්වද්දමින් ගෙවතු නගා සිටුවන්නට රණවිරු ශ්‍රමය දිනු දේශය වෙනුවෙන් යලි පුදන බව ලොවට කියන්නට කාලය උදාවී ඇත. තිස් වසරක මහා සංග්‍රාමයක වේදනාව අත්විඳි සිවිල් ජනතාව අද ඒ බිම මත දිගු කාලීන සැලසුම් සහිතව, කෙටි කාලීනව ක්‍රියාවට නැගුණු සංවර්ධන සංග්‍රාමයක ප්‍රතිඵල භුක්ති විඳිමින් සිටියි. ඒ පිළිබඳ අදහස් දක්වන නන්දිමිත්‍ර ගම පදිංචි 53 හැවිරිදි සිරියාවති මහත්මිය සඳහන් කරන පරිදි.

" **අද අපි එක ගමක සතුටින් ජීවත් වෙනවා මේ ප්‍රදේශයට ඇවිත් දෑ අවුරුද්දක් විතර වෙනවා. එදා ඉඳලා අදවන තුරු හමුදාවේ මහත්වරු අපිව බලා ගන්නවා. හමුදාවේ මහත්වරුන්ගේ පිහිටෙන් දැන්**

**අපට ඉන්න තැනක් තියෙනවා. මිහිපිට ඉන්න දෙවියන් ඔවුන් කියලයි මට නම් හිතෙන්නේ. මට මේ ගැන කියන්න වචන නැහැ. ඇත්තටම කිව්වොත් හමුදාවේ මහත්වරුන්ට වතුර වීදුරුවක් දෙන විට මට දැනේන්නේ දෙවියන්ට ගිලන්පස පූජා කරන වගේ හැඟීමක්. හමුදාව පිළිබඳ අපේ හිතේ තියෙන්නේ ඒ වගේ ගෞරවනීය හැඟීමක්. අද අපි මෙහෙම නිදහසේ ඉන්නේ අපේ රණවිරුවන් නිසා .....”**

යුද්ධය සමග සියල්ල අහිමි වුවා යැයි වේදනාවෙන් සිටි මිනිසුන් යළි පිබිදී ඇත. සශ්‍රීක නැවුම් පස මත වැපුරූ බීජවල අංකුර දැකීමෙන් ඔවුන් හදවත් වල උපදින ප්‍රීතිය අන් කවරෙකුටවත් අත්විඳිය නොහැකි ය.

සැළලිහිණිගම යුද්ධයෙන් පසු යළි ගොඩනැගූ ගම්මානයකි. එහි පවුල් 538 ක් පදිංචිව ඇති අතර එහි මෙහෙනි ආරාමයක් දක්නට ලැබේ. පශ්චාත් යුධ සමය තුළ භෞතික දියුණුව මෙන්ම අධ්‍යාත්මික පෝෂණය අතිශය වැදගත් ය. ඒ සඳහා ආගම මුල් විය යුතුය. මෙම ආරාමයේ ප්‍රධාන සිල් මාතාව 74 වයසැති වජිරානි සිල් මාතාවයි.



වජිරානි සිල්මාතාව

අවුරුදු 63 ක් වයසැති මල්ලිකා, වජිරානි සිල්මාතාව ප්‍රධාන සිල් මාතාව සමග මෙම ආරාමයේ වැඩ වසන අතර මල්ලිකා, වජිරානි සිල්මාතාවගේ මෙහෙය වීමෙන් දහම් පාසලක් පවත්වාගෙන යයි. ඇය පවසන පරිදි

**"අපි මෙහාට ඇවිත් අවුරුදු දෙකකට වැඩියි. මේ ගම්වලට ආපු මිනිස්සු හුඟක් හොඳයි. අපි දැනට ළමයි 100 කට පමණ දහම් පාසලක් කරගෙන යනවා. ගුරුවරු 8 ක් විතර ඉන්නවා. පෝය දවසට සීල ව්‍යාපාරයක් පවත්වාගෙන යනවා. එහිදී බණ භාවනා වැඩසටහන් කරනවා. හමුදාවේ මහත්වරු මැදිහත් වීමෙන් මේ ස්ථාන දියුණු කරන්න වැඩසටහන් රැසක් කරනවා හමුදාවේ මහත්වරු නැත්නම් මෙතන ආරාමයක් ගොඩනැගෙන්නේ නැහැ. ඉදිරියේ දී තවදුරටත් මෙම ස්ථානය වැඩිදියුණු කරන්නට කටයුතු කරනවා.**

සාමකාමී පරිසරයක් තුළ අධ්‍යාත්මික සංහිඳියාව වර්ධනය එතරම් අපහසු නොවේ. යුද්ධයේ පීඩිත ඔවුන්ගේ මනස යථා තත්ත්වයට පත් කරන්නට ආගමට සුවිශාල මෙහෙයක් ඉටුකල හැකිය. මෙම ව්‍යායාමයද එහි එක් පියවරකි. එම යහපත් වෙනස ඇති කරනු වස්, යුධ හමුදාව හා රජය මැදිහත් වීමෙන් විහාරාරාම රැසක් ස්ථාපිත කරමින් සිටියි. නාමල්ගම විහාරය, නන්දිමිත්‍රගම විහාරය, සැලලිහිණියාගම ආරාමය පමණක් නොව, යුධ කාලය තුළ ගරා වැටුණු පෞරාණික වෙහෙර විහාර ද ප්‍රතිසංස්කරණය කරමින් ආගමික පුනර්ජීවනය සඳහා කටයුතු කරමින් සිටියි.

පශ්චාත් යුධ සමයේ වන්නි කලාපය තුළ හමුදා නිළධාරින් විසින් ක්‍රියාත්මක වන දේශය පුබුදුවාලීමේ වැඩසටහන හුදෙක් පුද්ගල අපේක්‍ෂා සාක්‍ෂාත් කරන්නට මං පෙත් විවර කරන ලදි. ඒ පිළිබඳව තම අදහස් දක්වන එච්. එච්. බුද්ධිකා සුරංගනී (32) මහත්මිය සඳහන් කරන පරිදි

**"අද අපි වගා කරගෙන නිදහසේ ජීවත් වෙනවා. මට ළමයි තුන් දෙනෙක් ඉන්නවා. දෙන්නෙක් පාසල් යනවා. හමුදාවේ මැදිහත්වීමෙන් කරගෙන යන මේ වැඩපිළිවෙල අගය කරන්නට ඕන. මේ වනවිට වී වගාව වගේම මිරිස් සහ අනෙකුත් බෝග වගාව සිදුකරලා තියෙනවා. අපි උත්සාහ කරනවා මේ ප්‍රදේශයේ අර්තාපල් වගාව අත්හදා බලන්න. දැනටමත් අත්හදා බැලු බීජයන් සාර්ථක වෙලා තියෙනවා".**



එච්. එච්. බුද්ධිකා සුරංගනී මහත්මිය

ඔවුන්ගේ මේ වදන් තුළ ගැබ්ව ඇත්තේ අනාගත අපේක්ෂාවන් ය. ඔවුන් උත්සාය ගන්නේ මතු පරපුරට සුදුසු රටක් නිර්මාණය කරන්නට ය. ඔවුන් අපේක්ෂා භංගත්වයෙන් කටයුතු කරයි නම් මෙවන් දෑ අත්හදා බලන්නේ ද නැත. ඔවුන් දැන් හෙටත් ගැන සිතන බවට මෙය එක් සාක්ෂියක් පමණි.

පශ්චාත් යුධ සමය තුළ බොහෝ සංවර්ධන වැඩසටහන් ඉලක්ක ගතව ඇත්තේ දරුවන් වෙනුවෙන් ය. ඔවුන්ගේ අධ්‍යාපනය, සෞඛ්‍යය නංවාලීම තුළ ශක්තිමත් දරු පරපුරක් ගොඩනැංවීම අපේක්ෂා කරයි. ඒ වෙනුවෙන් පාසල් හා වෙනත් අධ්‍යාපන මධ්‍යස්ථාන ඇති කරමින් දරුවන් ඒ සඳහා යොමු කරමින් දැවැන්ත වැඩසටහනක් වන්නි ප්‍රදේශය තුළ ක්‍රියාත්මක වේ.

බෝගස්වැව විද්‍යාලය අද වනවිට ප්‍රදේශය තුළ ජනප්‍රිය වී ඇති අතර ළමුන් සංඛ්‍යාව 520 කි. මෙය 2013 ජනවාරි මාසයේ තවකාලිකව ආරම්භ කර 2013 මැයි මාසයේ ස්ථිරව ස්ථාපිත කරන ලදි. ළමුන් පස් දෙනෙකුගෙන් ඇරඹි මෙම පාසල අවුරුදු තුනක් වැනි කෙටි කාලයක් තුළ සීඝ්‍ර වර්ධනයක් අත්පත් කර ගෙන ඇත්තේ කුසගින්න පමණටම අධ්‍යාපන අවශ්‍යතාවයද දැනෙන නිසාවෙනි. එක් ස්ථිර ගොඩනැගිල්ලක් හා තාවකාලික ගොඩනැගිලි දෙකක පළමු වසරේ සිට දහවන වසර දක්වා ළමුන් අධ්‍යාපනය ලබන අතර සිංහල මාධ්‍යයෙන් උගන්වනු ලබයි.

ගුරුවරු 22 ක් ඉගැන්වීම් කටයුතු වල නියැලෙන අතර ඉන් 17 ක් කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන ඇත. 6 ක් ස්ථිර ගුරුවරු වේ. විදුහල්පතිවරයා පැවසු පරිදි 2014 වර්ෂයේ පැවති ශිෂ්‍යත්ව

විභාගයට ළමුන් 50 ක් ඉදිරිපත් වී තබෙන අතර ඉන් ළමුන් 26 ක් සමත් යන සහතික ලැබීමට සුදුසු වී ඇත. ඒ අනුව සමත් ප්‍රථිපල 50% ඉක්මවා යෑම පශ්චාත් යුධ සමය තුළ එක් අවුරුදු කාලසීමාවක් තුළ ඔවුන් ලද සුවිශාල ජයග්‍රහණයකි. මෙය වන්නි ප්‍රදේශය අධ්‍යාපනයෙන් ලද එක් ජයග්‍රහණයක් පමණි. පෙර පාසල් ඉදිකරමින් දරුවන්ගේ පූර්ව ළමාවිය සංවර්ධනය ද, පාසල් මගින් ප්‍රාථමික හා ද්විතියික අධ්‍යාපන අවස්ථා විවර කිරීම ද, තෘතියික අධ්‍යාපන අවස්ථා සඳහා මග පෙන්වීම ද දක්නට ඇත. ඒ තුළ ඔවුන් උත්සාහ ගන්නේ දරුවන් යහපත් ලෙස සමාතුයෝජනය කිරීමත්, උගත් පිරිසක් සමාජයට දායාද කිරීමටත් ය. තවමත් සිවිල් සමාජය තුළ අප්‍රකට මේ සුවිශාල මෙහෙවර නුදුරු අනාගතයේ දී රට තුළ සාක්ෂරතා මට්ටම ඉහළ යාමට ප්‍රබල බලපෑමක් වනු නොඅනුමාන ය.

වන්නි පුනරාවලෝකන වැඩසටහන යටතේ ඉඩම් ලබාදීම, නිවාස ලබාදීම, ජීවනෝපාය සරිකරලීම පමණක් නොව සුරක්ෂිත පානීය ජලය, සනීපාරක්ෂාව, දියුණු ජලප්‍රවාහන පහසුකම් කෙරෙහි ද අවධානය යොමුකර ඇත. දැනට පිරිපහදු කල ජලය හමුදා නිළධාරින්ගේ මැදිහත් වීමෙන් බෙදාහරින අතර අනෙකුත් ජල පරිභෝජන අවශ්‍යතා සඳහා නල ළිං ඉදිකර ඇත. වැව් අමුණු ප්‍රතිසංස්කරණය හරහා ද මිනිස් ජල පරිභෝජනයට අවශ්‍ය පහසුකම් සපුරා ඇත. මේ තුළ සමාජයේ සෞඛ්‍යය ආරක්ෂාව තහවුරු කිරීමට පියවර ගෙන ඇත.

සෞඛ්‍යය පහසුකම් සපුරාලීම සඳහා ගෙන යන වැඩසටහන තුළ ද සුවිශාල සමාජ මෙහෙයක් ඉටුකරනු ලබයි. නිරෝගී පරපුරක්

සමාජගත කරනු ලැබීම එහි අරමුණ වී ඇති අතර එය එක් අතකින් රට තුළ මුදල් ඉතිරි කර ගැනීමට ගත් එක් පියවරකි.

යුධ කාලය තුළ සංවර්ධන ඉලක්ක ලඟාකර ගැනීමට නොහැකි වුවද, අද වනවිට යටිතල පහසුකම් සීඝ්‍රයෙන් සංවර්ධනය වෙමින් පවතියි. විදුලිය ලබාදීම තුළ දෛනික කටයුතු පහසුකර ඇත. එහි ප්‍රතිලාභ 18500 ක් පමණ භුක්ති විදිමින් සිටියි. යටිතල පහසුකම් සංවර්ධන තුළ සමාජ අවස්ථා ලබාදීමෙන් ඔවුන්ගේ ඉච්ඡාභංගත්වය වැනි හැඟීම් යටපත් කල හැකි අතර රට තුළ අනෙක් ප්‍රදේශවල සිවිල් වැසියන් සේ වරප්‍රසාද ලබාගැනීමේ හැකියාව ඔවුන්ට ලබාදී ඇත.

මංමාවත් ඉදිකිරීම තුළ වන්නි ප්‍රදේශය රටේ අනෙකුත් ප්‍රදේශ සමග සම්බන්ධ කරමින්, පුද්ගලාන්තර සබඳතා තහවුරු කරන්නට අවශ්‍ය පහසුකම් සැපයීම සමාජ විද්‍යාත්මක කථිකාවතකට යොමු කල යුතු කරුණකි. මේ හේතුව තුළ ඔවුන් හුදකලා වීම අවම වන අතර ඥාති සබඳතා තහවුරු වීම, වෙළදපොළ ප්‍රවිෂ්ඨ වීම පහසු වීම, දරුවන්ට පාසල් යාම සඳහා පහසු වීම, ආයතන සමග සබඳතා පැවැත්වීම තුළ සමාජමය වශයෙන් පුනරුත්ථාපනයක් ලැබීමට අවකාශය විවර වීම දක්නට ඇත.

ප්‍රජා ශාලා පිහිටුවීම, සමිති සමාගම් පිහිටුවීම, ආගමික උත්සව සංවිධානය, ජාතික උත්සව සංවිධානය වැනි වැඩසටහන් දියත් කිරීම හරහා සමාජය තුළ අන්‍යොන්‍ය සබඳතාව තහවුරු කරලීම හා අනාගත අවධානම් තත්ත්වයන්ගෙන් මුදාගැනීම අපේක්ෂා කර ඇත. සමාජයක් කුමන මට්ටමෙන් සංවර්ධනය වුවත් එහි

ඒකාබද්ධතාවයක් නොමැති වුවහොත් සමාජ සංවිධානය බිඳවැටීම වැලැක්විය නොහැකි ය. යුධ කාලය තුළ වෙන්ව විවිධ පලාත් වල ජීවත් වූ ඔවුන් නැවත පදිංචි කල පසු, එකිනෙකා අතර සුහදතාවය වර්ධනය කරලීම ජාතික ඒකාබද්ධතාවය තුළ සමාජය ආරක්‍ෂා කර ගැනිමෙ පියවරකි.

යුද්ධය හේතුකොට ගෙන වැලලුනු ලාංකේය අනන්‍යතාව යලි මතුකරමින් ජනවිඥානය තුළ ලාංකේය බව තහවුරු කිරීමට දියත් කරන වැඩ සටහන තුළින් නුදුරු අනාගතයේ සුවිශාල වාසි රැසක් භුක්ති විදිය හැකි ය. පරිසර පද්ධතිය රැකගනිමින් කරනු ලබන ඉදිකිරීම්, නන්දිමිත්‍ර යෝධයාගේ පිළිරුව ඉදිකිරීම හා කිඹුලාගල ඇතුළු පෞරාණික වැදගත්කමින් යුක්ත ප්‍රදේශ රැසක් හදුනාගැනීම දෙස් විදෙස් සංචාරක ආකාර්ෂණය මෙම ප්‍රදේශය වෙත දිනාගැනීමට මහඟු අත්වැලක් වේ. ඒ තුළ වන්නි ප්‍රදේශයට හිමිවන වක්‍ර ප්‍රතිඵල රැසකි. සංචාරක ආකර්ශ්‍ෂණය සමග ඔවුන්ට වෙළදපොළ අවස්ථාවක් ද වේනම් ඒ තුළ රසායනික තෙල් පොහොර භාවිත නොකර තම ගෙවත්තේ වවා ගත් අස්වැන්න විකුණාගැනීමට කදිම අවස්ථාව උදා වේ. හමුදාව මගින් දියත් කරන වන්නි නගා සිටුවීමේ වැඩපිලිවෙළ තුළ නිර්මාණය කරන ලද ආදර්ශ ගෙවත්ත සංකල්පය ලංකාවේ අනෙකුත් ප්‍රදේශයන් තුළ ව්‍යාප්ත කල හැකි නම් රට ස්වයංපෝෂිත කිරීම එතරම් අපහසු කර්තව්‍යයක් නොවනු ඇත. දේශීය සංචාරක ආකර්ෂණය හරහා එම ආදර්ශය ද ඔවුන් ව්‍යාප්ත කරනු ඇත.

**වන්නි නැවත පදිංචි කිරීම, තිරසාර සංවර්ධනය හා ලාංකේය අනාගතය**

සුභ සාධනයේ ප්‍රගතිය සංවර්ධනය ලෙස සංවර්ධන විද්‍යාඥයින්, සමාජ විද්‍යාඥයින් අර්ථකථනය කර ඇත. මුල්ම මානවයා ගහට පොත්ත මෙන් සොබාදහම සමග බැදී සිටින ලදි. පසුව ඔහු සොබාදහමේ ඇතැම් අංග පාලනයට හා ඇතැම් සීමා ජය ගැනීමට ගත් උත්සාය මත යම් යම් භෞතික ගොඩනැගීම් හා අකල්පිය වෙනස්වීම් සිදුකරන ලදි.

වන්නි නැවත පදිංචි කිරීම හා තිරසාර සංවර්ධන සංකල්පය ගත් විට එය පරසර හිතකාමි වැඩසටහනක් ලෙස හදුන්වා දිය හැකි ය. වන්නි ජනතාව කෘෂිකාර්මික දිවි පෙවෙතෙක් ගතකරන අතර ගොවිතැනේ දී මෙන්ම ගෙවතු වගාවේදී කාබනික පොහොර භාවිතය හඳුනාගැනීමට පුළුවන. එසේම ගෙවත්තට වෙන්කල ඉඩමේ පලතුරු, එළවලු, ධාන්‍ය වර්ග පමණක් නොව ඖසු වර්ග හා මල් වර්ග සමග දිගු කාලීන බෝග වර්ග වන කොස්, පොල්, දෙල් වැනි ශාඛ ද වගාකිරිම තුළ ස්වයංපෝෂිත වන්නට ඔවුන් උත්සාහ දරයි. සෑම පවුලකටම කිරි ගවයෙකු ලබාදීමට දියත් කර ඇති වැඩසටහන තුළ සෞඛ්‍යය මට්ටම නංවාලීමට හා වගාවට අවශ්‍යය ගොම පොහොර ලබා ගැනීමට අවස්ථාව උදා කර ඇත. එමෙන්ම ගම නගා සිටුවීමට දියත් කර ඇති වැඩසටහන් පරිසර පද්ධතියට හානි නොවන ආකාරයෙන් සිදුකරලීම ද ඇගයිය යුතු කරුණකි.

තිරසාර සංවර්ධන සංකල්පය තුළ ගැබ් වන්නේ පාරිසරික ආරක්ෂණ වැඩසටහනක් තුළින් ලබන දියුණුව පමණක් නොව ආර්ථික සංවර්ධනය, ප්‍රජා සංවර්ධනය ද එයට ඇතුළත් වේ. යුධ හමුදාවේ මැදිහත් වීමෙන් සිදුකරනු ලබන මෙම ව්‍යාපෘතින් සංක්ෂිප්ත කොට ගත්කල එය තිරසාර සංවර්ධනය ඉලක්කගත වී ඇති බව පැහැදිලි වේ.

උක්ත කරුණ විශ්ලේෂණයේදී පැහැදිලි වන්නේ රජයේ හා ඉහළ නිළධාරින් හා සාමාන්‍ය ජනතාවගේ යුධ හමුදාව විසින සිදුකරන ලද නැවත පදිංචි කිරීමේ ව්‍යාපෘතිය හා එහි බැදුණු පශ්චාත් යුධ සමයේ සංවර්ධනය ක්‍රියාදාමය ලංකාවේ සංවර්ධන ගමනට ආදර්ශයක් කරගත හොත් සංවර්ධනය නැමති ඉලක්කය ජයගන්නට එතරම් කාලයක් ගත නොවන බවයි.

යුධ හමුදාවේ මැදිහත් වීමෙන් සිදුකරන මෙම කාර්යය සුළුවෙන් තක්සේරු කළ නොහැකි ය. තිස් වසරක යුද්ධයෙන් පසු බිඳවැටුණු භෞතික පරිසරය මෙන්ම මිනිසුන්ගේ මානසික පරිසරය යලි යථා තත්ත්වයට පත්කිරිම ඔවුන් මුහුණ දුන් විශාල අභියෝගයකි. දිවයිනේ නන් දෙස විසිරී සිටි පුද්ගලයින් සොයා ඔවුන් නැවත පදිංචි කිරීම හා ඒ සඳහා අවශ්‍යය භූමි වෙන්කිරිම හා ජන ජීවිතය ස්ථාපිත කිරීම, ජනතාවට ජීවත් වීමට සුදුසු ස්ථිර නිවාස ගොඩනැංවීම හා

## තිරසාර සංවර්ධනය

ආර්ථික සංවර්ධනය

කෘෂිකාර්මික සංවර්ධනය
/මිරිදිය ධීවර
කරමාන්තය නංවාලීම/
රජය රැකියා අවස්ථා
සංවර්ධනය/
වෙළඳපොල හඳුන්වාදීම/
බැංකු කටයුතු ව්‍යාප්තිය

ප්‍රජා සංවර්ධනය

ආගමික කටයුතු/ සමිති
සමාගම්/ සෞඛ්‍ය කටයුතු/
පොදු ස්ථාන නංවාලීමේ
පහසුව/ සංස්කෘතික
කටයුතු/ ක්‍රීඩා කටයුත /
පුද්ගල ආකල්ප
ගොඩනැංවීම/ අදාල
ආරක්ෂාව සහතික කිරීම.

පාරිසරික සංවර්ධනය

වගා ක්‍රම හඳුන්වා දීම/
කාබනික පොහොර භාවිතා
කිරීමට ජනතාව
හුරුකිරීම/පරිසරය පිළිබඳ
සුභවාදී ආකල්ප ඇතිකරලීම/
සංරක්ෂණ ක්‍රම ව්‍යාප්තිය

වන්නි නැවත පදිංචි කිරීම හා තිරසාර සංවර්ධනය සංෂිප්තයක් ලෙස

පුරන් වූ කුඹුරු අක්කර සිය ගණනක් යලි අස්වැද්දීම හා ඒ සඳහා අවශ්‍ය පහසුකම් සපයාදීම, මහාමාර්ග විදුලිය ඇතුළු යටිතල පහසුකම් සංවර්ධනය පොදු ප්‍රවාහන සේවා සැපයීම, පොදු ස්ථාන පිළිසකර කිරීම වැනි කාර්යයන් හමුදාවේ මැදිහත්වීම මගින් සිදුකරන අතරම බිඳවැටුණු පෞරුෂය යලිගොඩනැංවීම සඳහා ආගම මුල් කරගත් වැඩසටහන් මෙන්ම ධනාත්මක ආකල්ප වර්ධනය කිරීමේ වැඩසටහන් ද සිදුකරන ලදී.

එමෙන් ම නවීකරණයට බාධා නොවන පරිදි සාම්ප්‍රදායික ග්‍රාමීය සමාජ ව්‍යුහයේ යහපත් පැතිකඩ ආවරණය කරමින් ස්ථාපිත කරනු ලැබු ගම තුළ අන්‍යෝන්‍ය බැඳීම සුරක්ෂිත කරමින් ඒකීය සමාජ ව්‍යුහයක් ගොඩනැගීමට අවශ්‍ය සියළු කටයුතු සමස්ත අංශයන් ආවරණය වන පරිදි ඉටුකරන බව උක්ත කරුණු විශ්ලේෂණය තුළ මැනවින් පැහැදිලි වේ.



දේශපාලන නායකත්වය, ශ්‍රී ලංකා යුධ හමුදාවේ හිටපු සහ වත්මන් හමුදාපතිවරයාගේ දායකත්වය තුළ වන්නි ආඥාපතිවරයාගේ උපදෙස් සහ මෙහෙයවීම මත සිදුකරමින් පවතින එම සද්ක්‍රියාවලිය අවසාන වශයෙන් මෙසේ සංක්ෂිප්ත කොට සටහන් කර තබමි.

**වන්නියේ වැව් අමුණු අහස් දිය වැලඳගෙන කුඹුරු සරුසාරවත් කරමින් සිටියි. එබිම මත මිනිසුන් යදම් සේ සවිමත්ව ලක්බිමේ අනන්‍යතාවය හෙට ලොවට කියන්නට සැරසෙයි. මෙලෙස එකින් එක සැබෑ වන්නේ ලක්මව් දුටු සුභ සිහිනයන් නොවේද?**

**රණවරුන් විසින් සතුරාට එරෙහිව දියත් කරන ලද සංග්‍රමයෙන් පසු එළඹි සංවර්ධන සංග්‍රාමය තුළ සිදුවන වන්නියේ පිබිදීම හඬගා කියන්නේ උත්තරීතර ජාතික කර්තව්‍යයේ තවත් එක් පැතිකඩක් ආවරණය කළ බව නොවේද?**

**රණවිරුවන් ජීවිත පරිත්‍යාගයෙන් දිනූ බිම මත නැගී සිටින අපට ද පැවරුණු යුතුකම් රැසක් ඇත. එනම් දිනූ දේශය මත එකාමෙන් නැගී සිට සියළු බලවේගයන් පරදා හෙට පරපුරට ඇවැසි අනාගතයක් නිර්මාණය කරන්නට ය.**

## ආශ්‍රිත ග්‍රන්ථ හා ලිපි නාමාවලිය

***අනුරාධපුර යුගය.***, 1965, සංස්. අමරදාස ලියනගමගේ සහ රණවීර ගුණවර්ධන, විද්‍යාලංකාර විශ්වවිද්‍යාලය, කැලණිය, 91-111.

උයන්ගොඩ, ජයදේව., 2003, ***ගැටුම් සිවිල් යුද්ධ සහ සාමය ගොඩනැගීම***, කොළඹ, සමාජ විද්‍යාඥයින්ගේ සංගමය.

කටුගම්පොල, රාජා., 2007, ***සංග්‍රාම පුරාණය***, කොළඹ, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

කරුණාතිලක, කේ., 1998, ***සමාජ විද්‍යා***, කඩවත, මාලිංග ප්‍රකාශකයෝ.

කරුණාරත්න, ඒ.එම්. 2002, ***වංශකථාවල නොකියවෙන ශිලා ලිපිවලින් හෙළිවන ලංකා ඉතිහාසය.***, දයාවංශ ජයකොඩි සහ සමාගම, කොළඹ, 29.

***කාර්ය සාධනය.,*** 2008, ජාතිය ගොඩනැගීමේ හා වතු යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ අමාත්‍යාංශය

***කාර්ය සාධනය.,*** 2009, නැවත පදිංචි කිරීමේ අමාත්‍යාංශය

නිකලස්, සී. ඩබ්ලිව්., 1979, පුරාතන හා මධ්‍යතන ලංකාවේ ඓතිහාසික ස්ථාන විස්තරය, ***රාජකීය ආසියාතික සමිතියේ ශ්‍රී ලංකා ශාඛාවේ සඟරාව,*** පරිවර්තනය.

**ප්‍රායෝගික සිංහල ශබ්ද කෝෂය.,** ( දෙවැනි කාණ්ඩය) 1984, සංස්. හරිස්චන්ද්‍ර විජයතුංග, සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය, කොළඹ, 1391.

**මහාවංසය.**, 1967, සංස්. හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි, බටුවන්තුඩාවේ දේවරක්ෂිත පඬිතුමා, කොළඹ, රත්නාකර පොත් වෙළඳ ශාලාව. (*මව.*)

මේධානන්ද, එල්ලාවල., 2001, ***දුටුගැමුණු රජතුමාගේ දශමහා යෝධයෝ***, දීපානි ප්‍රකාශන, නුගේගොඩ, 1.

විජේතුංග, සිරිසමන්., 2012, ***ශ්‍රී ලංකාවේ පුරාණ උරුමය***, සමුද්‍ර පොත් ප්‍රකාශකයෝ, කොළඹ, 82.

වීරසූරිය, ගුණසිරි., 1996, ***යුද්ධය***, වරකාපොළ, ආරිය ප්‍රකාශකයෝ

***රසවාහිනී.,*** 1896, *සංස්. සරණතිස්ස හිමි*, කොළඹ, විද්‍යාසාර මුද්‍රණාලය.

***සද්ධර්මාලංකාරය.***, ශ්‍රී ලංකා ප්‍රචීන භාෂෝපකාර සමිතිය. (*සද්මාලං.*)

***සහස්සවත්ථුප්පකරණය.***, 1959, සංස්. පොල්වත්තේ බුද්ධදත්ත, 96. (*සහස්ස* )

සිරිවීර, ඉන්ද්‍රකීර්ති., 2001, ***රජරට ශිෂ්ටාචාරය සහ තිරිතදිග රාජධානි***, දයාවංශ ජයකොඩි හා සමාගම, කොළඹ.

***සිංහල ථූපවංශය.,*** 1996, සංස්. එච්. එම් මොරටුගම, රත්න ප්‍රකාශකයෝ, කොළඹ.

සෙනවිරත්න චාමින්ද., (1990) ***නිරායුධකරණය සාමය සහ සංවර්ධනය***, කොළඹ, ඇම්. ඩී ගුණසේන සහ සමාගම.

***ශ්‍රී සුමංගල ශබ්ද කෝෂය.***, (ද්විතීය භාගය) සංස්. වැලිවිටියේ සෝරත, එස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ, 822. (ශ්‍රි.සු.ශබ්.කෝ )

***ArchaeologIcal Survey of Ceylon*** Annual Report., 1934, Colombo, Archaeological Survey Department, 84.

Brohier, R.L., 1934(1979), ***Ancient Irrigation Works in Ceylon***. Part i-iii. Colombo, Ministry of Mahaweli Development.

Cooray, P.G., 1967 (1984), ***An Introduction to the Geology of Sri Lanka*** (Ceylon), Colombo, National Museums of Sri Lanka.

Deraniyagala, S.U., 1992a, ***The Prehistory of Sri Lanka***; An Ecological Perspective, Part I, Colombo, Archaeological Survey Department.

Deraniyagala, S.U., 1992b, ***The Prehistory of Sri Lanka***; An Ecological Perspective, Part II, Colombo, Archaeological Survey Department.

***Inscription of Ceylon Vol. i. Part. i.,*** 1970, eds. S. Paranavitana, Colombo, Department of Archaeology. (*Ic*)

Parker, H., 1909 (1981), Ancient ***Ceylon***, New Delhi, Asian Educational Services.

Ragupathy, P., 1987, ***Early Settlements in Jaffna***: An Archaeological Survey. Mrs.T. Ragupathy. Madras.

Senavirathna, S., 1984, The archaeology of the Megalithic-Black and Red Ware complex in Sri Lanka. ***Ancient Ceylon, The journal of the archaeological Department of Sri Lanka***, Colombo, Vol.5: 237-307.